සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade: 11 ශ්‍රේණිය	නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය I, II	කාලය / நேரம் / Time: පැය 03යි


නම / பெயர் / Name: ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. : .....



- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකය ද සැපයෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

01. නාභි දෙකක් සහිත (Focuses) ජ්‍යාමිතික හැඩයකින් සමන්විත රූපය කුමක්ද?
(1) වෘත්තයයි (2) පරාවලයයි
(3) ඉලිප්සයයි (4) සමචතුරස්‍රයයි

02. ඉංජිනේරු ඇඳීමේදී භාවිතා වන කඩ රේඛා මගින් අදහස් කරන්නේ කුමක්ද?
(1) නොපෙනෙන දාර දැක්වීම (2) මධ්‍ය අක්ෂය දැක්වීම
(3) ඡේදිත ස්ථාන දැක්වීම (4) සමමිතික බව දැක්වීම


03. සිලින්ඩරාකාර වස්තුවක් පහත පරිදි A හා B රේඛාවෙන් ඡේදනය කර ඇත. එහි නිවැරදි විකසනය වන රූපය කුමක්ද?



(1) 
(2) 
(3) 
(4) 

04. ඝන වස්තුවල සෘජු ප්‍රක්ෂේපණ රූප ඇඳීමේදී ඉදිරි පෙනුමට ඉහළින් සැලැස්ම දක්වා ඇත්තේ කුමන කෝණ ක්‍රමයට ද?
(1) ප්‍රථම කෝණ ක්‍රමයට ය. (2) තෙවන කෝණ ක්‍රමයට ය.
(3) පර්යාලෝක ක්‍රමයට ය. (4) ත්‍රිමාන ක්‍රමයට ය.


05. කේතුවක් එක් එක් ස්ථානවලින් ඡේදනය කළ විට ලැබෙන හැඩතල විවිධාකාරය. මෙම කේතුව A, B, C, D ස්ථානවලින් ඡේදනය කලවිට ලැබෙන හැඩතල පිළිවෙලින් කුමක්ද?



(1) වෘත්තය, බහුවලය, ඉලිප්සය, පරාවලය
(2) වෘත්තය, ඉලිප්සය, පරාවලය, බහුවලය
(3) බහුවලය, ඉලිප්සය, පරාවලය, වෘත්තය
(4) බහුවලය, ඉලිප්සය, පරාවලය, වෘත්තය

Past Papers Wiki

06. පහත සංකේතයෙන් නිරූපණය වන්නේ



(1) ද්විමාන ප්‍රක්ෂේපණ ක්‍රමයයි
(2) ත්‍රිමාන ප්‍රක්ෂේපණ ක්‍රමයයි
(3) තෙවන කෝණ ප්‍රක්ෂේපණ ක්‍රමයයි
(4) ප්‍රථම කෝණ ප්‍රක්ෂේපණ ක්‍රමයයි.

07. ෆෙරස් ලෝහ නිෂ්පාදනයේ මූලික අවස්ථාව අමුයකඩ ය. අමුයකඩ නිශ්පාදනය සඳහා යොදා ගනු ලබන උෆ්ෂ්ටකය කුමක්ද?
(1) විද්‍යුත් උෆ්ෂ්මකය
(2) නියුපෝලා උෆ්ෂ්මකය
(3) ධාරා උෆ්ෂ්මකය
(4) විවෘත උෆ්ෂ්මකය

08. එන්ජින් බඳ, බෙයාරින් වසුන් සහ යන්ත්‍ර නිවෙස්නා (Housing) සෑදීම සඳහා බහුලව භාවිතා කරන ලෝහය කුමක්ද?
(1) චීනචට්ටි
(2) මෘදු වානේ
(3) අධිකාබන් වානේ
(4) ලෝකඩ

09. ලෝහයක් බාහිර බලයක් නිසා එකට ගැටීමෙන් පසුව පහසුවෙන් කොටස්වලට වෙන්වී යාම එම ලෝහයේ කුමන ගුණය ලෙස හඳුන්වයි ද?
(1) භංගුරතාවය
(2) තන්‍යතාවය
(3) ආහන්‍යතාවය
(4) සුවිකාර්යතාවය

10. යකඩ නිෂ්පාදනයක මතුපිට මළකෑමෙන් ආරක්ෂා කිරීම සඳහා මළ නොකන ලෝහයක් මතුපිට තැන්පත් කිරීම හෝ ගිල්වා ගැනීම කෙරේ. මෙම ක්‍රමය කුමක්ද?
(1) ඔප දැමීම
(2) ගැල්වනීකරණය
(3) පින්තාරු කිරීම
(4) වාත්තු කිරීම

11. තඹ හා ටින් සංයෝගයෙන් සෑදී ඇති මිශ්‍ර නිෆෙරස් ලෝහය කුමක් ද?
(1) පිත්තල
(2) ලෝකඩ
(3) මොලොක් පොඩි
(4) වානේ


12. ලෝහ කියත භාවිතයේ දී නොකළ යුතු ක්‍රියාව කුමක්ද?
(1) කියත් තලය සවි කිරීමේදී මිටේ සිට ඉදිරි පැත්තට දත් යොමුවනසේ සවිකළ යුතුය.
(2) කියත ඉදිරියට දිවවීමේදී පමණක් බර යෙදිය යුතුය.
(3) කියත ගැස්සීම් වලින් තොරව තලය සම්පූර්ණයෙන් දිවෙන සේ රිද්මයානුකූල ලෙස කැපිය යුතුය.
(4) කියත ඉදිරියට හා පසුපසට දිවවීමේදී හොඳින් බර යෙදිය යුතුය.

13. ඇඹරුම් විදුම් කටුවක මුවාත් කෝණය සකසාගැනීම සඳහා උපයෝගී කරගන්නා මුවාත් තැබීමේ ක්‍රමය කුමක්ද?
(1) රෝද ගිනිගල
(2) ගැලපෙන හරස්කඩ හැඩය සහිත පීරක්
(3) පැතලි කාබොරන්ඩම් ගලක්
(4) දියවැලි කඩදාසියක්

14. සියලුම වානේ වර්ග නිපදවන්නේ පිරිසිදු යකඩ ලෝහයට ඉතා සුළු ප්‍රතිශතයක් කාබන් මූලද්‍රව්‍ය මිශ්‍ර කිරීමෙනි. ඒ අනුව කාබන් 0.8% සිට 1.0% දක්වා මිශ්‍ර කර යොදාගන්නා වානේ වර්ගය කුමක්ද?

(1) චීනචට්ටි ය.
(2) මෘදු වානේය.
(3) මධ්‍යම කාබන්වානේ ය
(4) අධි කාබන් වානේ ය.

15. රූපයේ දැක්වෙන්නේ තුනී ලෝහ තහඩු සම්බන්ධ කිරීම සඳහා භාවිතා කෙරෙන උපකරණයකි. මෙම උපකරණය කුමක් ද?



(1) මිටියට් කටුව
(2) පොප් මිටියම් යන්ත්‍රය
(3) වාටි මුට්ටු කටුව
(4) වට අඩි සට්ටම


16. ගිනි නිවීමේ උපකරණ සූදානම්ව තබාගැනීම විධිමත් කර්මාන්තශාලාවක ලක්ෂණයකි. නිල් පැහැති වර්ණය භාවිතා කර ඇත්තේ කුමන වර්ගයේ ගිනි නිවන උපකරණ හඳුනා ගැනීමට ද?

(1) වියලි රසායනික ගිනි නිවන උපකරණ
(2) කාබන් ඩයොක්සයිඩ් ගිනි නිවන උපකරණය
(3) පෙන ගිනි නිවන උපකරණය
(4) ජල ගිනි නිවන උපකරණය

17. ගිනි ගැනීම සඳහා අත්‍යවශ්‍ය අංග තුන සඳහන් වරණය කුමක්ද?

(1) ගිනිගන්නා ද්‍රව්‍ය, තෙල් හා ඔක්සිජන්
(2) ගිනිගන්නා ද්‍රව්‍ය, තාපය හා ඔක්සිජන්
(3) ඉන්ධන, වාතය, ගිනිගන්නා ද්‍රව්‍ය
(4) හිරුඑළිය, ගිනිගන්නා ද්‍රව්‍ය හා සුළඟ

18. රූපයේ දක්වා ඇත්තේ වායු වෙල්ඩින් ක්‍රමයේදී යොදාගන්නා මුට්ටු වර්ගයකි. මෙය කුමක්ද?



(1) නෙරිගැටි මූට්ටුව
(2) සරල මුට්ටුව
(3) තනි හේත්තු මුට්ටුව
(4) V මුට්ටුව

19. වාහනයක සවිකර ඇති ඊයම් අම්ල බැටරියක කෝෂවල දියර (විද්‍යුත් විච්ඡේද්‍ය) මට්ටම් බෙහෙවින් අඩුවී ඇති අවස්ථාවක දියර මට්ටම නිවැරදි කිරීම සඳහා කෝෂවලට යෙදිය යුතු දියරය කුමක්ද?

(1) සල්ෆියුරික් අම්ලය
(2) උණුකර සිසිල් කළ ජලය
(3) සල්ෆියුරික් අම්ලය සහ ජලය මිශ්‍රණය
(4) ආස්‍රැත ජලය

20. මෝටර් වාහනයකට බැටරිය සවි කිරීමේ ක්‍රියාවලියකදී අවසාන වශයෙන් සිදුකරන ක්‍රියාවලිය කුමක් ද?

(1) සෘණ අග්‍රය සවිකිරීම
(2) විලායකය (fuse) සවිකිරීම
(3) ධන අග්‍රය සවිකිරීම
(4) විද්‍යුත් විච්ඡේද්‍ය පිරවීම

21. එන්ජිමක් තුළ ක්‍රියාත්මක වන සලඟිල්ල, කැමි දණ්ඩ හා පිස්ටනය යන උපාංග ක්‍රියාත්මක වීමේදී ඒවායේ සිදුවන චලිත අනුපිළිවෙලින් දක්වා ඇත්තේ

(1) චක්‍රීය, දෝලනය හා අනුවාටුම

(2) දෝලනය චක්‍රීය හා රේඛීය

(3) දෝලනය, රේඛීය හා චක්‍රීය

(4) අනුවාටුම, දෝලනය හා චක්‍රීය

22. දෙපහර කුඩා එන්ජින් සඳහා යොදා ගන්නා පෙට්‍රොඩයිල් ක්‍රමයේදී, පෙට්‍රල් සහ ස්නේහන තෙල් මිශ්‍ර කරන අනුපාතය කවරේද?

(1) 15 : 1 (2) 12 : 1 (3) 10 : 1 (4) 25 : 1

23. බර වාහනවල තිරිංග පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා වැඩිවශයෙන් යොදා ගනු ලබන ජව සම්ප්‍රේෂණ ක්‍රමය කුමක්ද?

(1) යාන්ත්‍රික ක්‍රමය (2) සම්පීඩිත වාත ක්‍රමය

(3) ද්‍රව පීඩන ක්‍රමය (4) රික්ත ක්‍රමය

24. යතුරුපැදි එන්ජිමක පුළිඟු පේනුවෙන් විද්‍යුත් පුළිඟුවක් ඇති කිරීම සඳහා ලබාදිය යුතු අධිවෝල්ටීයතාව කොපමණ ද?

(1) 5000 V (2) 15000 V (3) 10000 V (4) 20000 V

25. මැග්නිටෝ ජ්වලන පද්දතිය සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය කුමක්ද?

(1) ජ්වලන ආමේවරය තුළ ප්‍රාථමික දඟරය හා ද්විතියික දඟරය ලෙස දඟර දෙකක් වෙයි.

(2) ජ්වලන පද්ධතියට විදුලිය සපයන්නේ එය විසින්ම සපයනු ලබන අධිවෝල්ටීයතාවයක් මගිනි.

(3) ස්ථීර චුම්බක සහිත ජවරෝධයක් ක්‍රියාත්මක වෙයි.

(4) සිලින්ඩර වැඩි සංඛ්‍යාවකින් යුතු එන්ජින් සඳහා භාවිතා වෙයි.

26. ස්නේහන තෙල් වර්ගීකරණයේදී දුස්ස්‍රාවිතාවය ප්‍රධාන සාධකයකි. දුස්ස්‍රාවිතාවය පරීක්ෂා කිරීම සඳහා යොදා ගනු ලබන මිනුම් උපකරණය කුමක්ද?

(1) හයිඩ්‍රොමීටරය (2) සේ බෝල්ට් විස්කො මීටරය

(3) මල්ටිමීටරය (4) ගැල්වනෝමීටරය

27. තාප නිනාල සංසරණ ක්‍රමයේදී එන්ජිම තුළ ඇති සිසිලන ජලය රේඩියේටරය හරහා ගමන් කරවනු ලබන්නේ,

(1) ජල පොම්පය මගිනි (2) සංවහන ධාරා මගිනි

(3) සන්නයනය මගිනි (4) ගුරුත්ව ක්‍රමය මගිනි

28. ද්‍රවසිසිලන පද්ධතිය සහිත එන්ජිමක ඉක්මනින් ක්‍රියාකාරී උෂ්ණත්වයකට ගෙන ඒම සඳහා උපකාරීවන උපාංගය කුමක්ද?

(1) පීඩන පියන (2) සිසිලන පංකාව

(3) විකිරකය (4) උෂ්ණත්ව පාලක වැල්වය

29. කෘත පෝෂණ ස්නේහන පද්ධතියක ස්නේහන තෙල් ගමන් කරන නිවැරදි පිළිවෙල මින් කුමක්ද?

(1) දැල් පෙරහන → තෙල් පොම්පය → සියුම් තෙල් පෙරහන → ප්‍රධාන තෙල් ගැලරිය

(2) තෙල් පොම්පය → දැල් පෙරහන → ප්‍රධාන තෙල් ගැලරිය → සියුම් තෙල් පෙරහන

(3) සියුම් තෙල් පෙරහන → තෙල් පොම්පය → දැල් පෙරහන → ප්‍රධාන තෙල් ගැලරිය

(4) ප්‍රධාන තෙල් ගැලරිය → දැල් පෙරහන → තෙල් පොම්පය → සියුම් තෙල් පෙරහන

30. මෝටර් වාහන එන්ජිමක සිලින්ඩර බඳ හා හිස සාදා ඇති ශිල්පිය ක්‍රමය වන්නේ

(1) ලෝහ කුට්ටියක් හැඩ ගසා ගැනීමයි.

(2) අච්චුවක් තුළ වාත්තු කිරීමයි.

(3) ලියවන පට්ටලයකින් ලියවා ගැනීමයි

(4) හැඩ කපා ලෝහ කොටස් පෑස්සීමයි

31. තුනී ලෝහ තහඩු හා කම්බි තෝරා ගැනීමේදී කාර්මිකයෙකුට අවශ්‍යම උපකරණයක් පහත රූපයේ දැක්වේ. එය කුමක්ද?

(1) ස්පර්ශක අමානය

(2) සම්මත කම්බි අමානය

(3) බර්මින්හැම් අමානය

(4) ස්වායය මට්ටම





32. යන්ත්‍රවල විවිධ චලිත වර්ග යොදාගෙන ඇත. ලක්ෂ්‍යයක් කේන්ද්‍ර කරමින් දෙපසට සිදුවන පැද්දීම හඳුන්වන්නේ කුමන චලිතය නමින් ද?

(1) අනුවැටුම් චලිතය (2) භ්‍රමණ චලිතය

(3) රේඛීය චලිතය (4) දෝලන චලිතය

33. භ්‍රමණ චලිතය රේඛීය චලිතයක් බවට පරිවර්තනය වන අවස්ථාවක් වන්නේ

(1) යතුරු පැදියේ තිරිංග ක්‍රියාකාරීත්වයයි

(2) සමාන්තර දඬු අඬුවේ හතු එහා මෙහා කරකැවීමයි

(3) එන්ජිමක පිස්ටනය හා සබැඳුම් දණ්ඩේ ක්‍රියාකාරීත්වයයි

(4) ඔරලෝසු බට්ටාගේ චලිතයයි.

34. මෝටර් රථ පින්තාරු කිරීමේදී භාවිතා වන තීන්ත ආලේපණය කිරීමේ ක්‍රමය කුමක්ද?

(1) බුරුසුවක් මගිනි (2) ගැල්වනීකරණය මගිනි

(3) විසිරකය මගිනි (4) ගිල්වීම මගිනි

PAST PAPERS WIKI

35. වාත්තු කර්මාන්තයේදී වාත්තු මල අවශ්‍ය වන්නේ

(1) වාත්තු පස් මිශ්‍රණය සකස් කිරීමේදී ය.

(2) වාත්තු දියරය සකස් කිරීමේදී ය.

(3) වාත්තු කළ භාණ්ඩය ඉවත් කර ගැනීමේදී ය.

(4) ආරු කුහරය සකස් කර ගැනීමේදී ය.

36. යතුරු පැදියක තිරිංග පහන (Brake Light) සඳහා භාවිතා කරන විදුලි බුබුලේ සූත්‍රිකා දෙකකි. මෙම සූත්‍රිකා දෙකේ ක්ෂමතා කොපමණද?

(1) 21W හා 5W ය. (2) 5W හා 5W ය.

(3) 21W හා 21W ය. (4) 10W හා 21W ය.

37. පහත කුමන කාර්යයයේ ආරක්ෂක පූර්වෝපායක් ලෙස රබර් අත්වැසුම් භාවිතා කිරීම වඩාත් යෝග්‍ය වේද?

(1) මිටියම් වැඩ කිරීම සඳහා

(2) විදුලි ආශ්‍රිත කාර්යය සඳහා

(3) කම්මල් ලිප ආශ්‍රිත කාර්යයන් සඳහා

(4) එන්ජින් අලුත්වැඩියා කිරීම සඳහා

38. දෝෂ සහිත විදුලි රැහැන් සම්බන්ධතාවක් හෝ රැහැන් අධික ලෙස රත්වීම නිසා ඇතිවන විදුලි ගින්නකදී, කාර්මිකයෙකු විසින් පළමුව සිදු කළ යුත්තේ

(1) අදාල ස්ථානයේ විදුලිය විසන්ධි කිරීමයි.

(2) ක්ෂණිකව එම ස්ථානයෙන් ඉවත් වීමයි.

(3) ගිනි නිවන ඒකකයට දැනුම් දීමයි.

(4) වටිනා උපකරණ එම ස්ථානයෙන් ඉවත් කිරීමයි.

39. අලුත් වාහන එන්ජිමක ප්‍රථම ස්නේහන තෙල් සහ තෙල් පෙරහන මාරු කිරීම කළ යුත්තේ වාහනය කොපමණ දුර ප්‍රමාණයක් ධාවනය කළ විටද?

(1) 600 km (2) 800 km (3) 750 km (4) 700 km

40. වාත සිසිලන එන්ජිමක ඇති සිසිලන වරල් මගින් සිදු කරනු ලබන කාර්යය කුමක්ද?

(1) එන්ජිමේ පුඹුකයේ (Blower) කල් පැවැත්ම අඩු කරයි.

(2) එන්ජිමේ වාතය ගැටෙන ක්ෂේත්‍රඵලය වැඩි කරයි.

(3) එන්ජිමේ වාතය ගැටෙන ක්ෂේත්‍රඵලය සීමා කරයි.

(4) එන්ජිමේ ඉන්ධන කාර්යක්ෂමතාවය අඩු කරයි.

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade } 11 ශ්‍රේණිය

නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය II


නම / பெயர் / Name } .....

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } .....

- පළමු ප්‍රශ්නය ද තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. i 1 A ඊතලය දෙසින් බලා ඉදිරි පෙනුමද
2 B ඊතලය දෙසින් බලා පැති පෙනුමද
3 C ඊතලය දෙසින් බලා සැලැස්ම ද

තෙවන කෝණ ඍජු ප්‍රක්ෂේපණ චිත්‍ර ඇඳීමේ මූලධර්මයට අනුව සම්පූර්ණ පරිමානයට අඳින්න. සියලු මිනුම් මිලිමීටර් වලිනි.



ii අරය 17mm වන වෘත්තයක කේන්ද්‍රයේ සිට 55mm දුරින් පිහිටි p නම් ලක්ෂයේ සිට වෘත්තය මත ලක්ෂ්‍යයට ස්පර්ශකය අඳින්න.

02. පාසලේ අවශ්‍යතාවයක් මත යාන්ත්‍රික තාක්ෂණවේදය හදාරන සිසුන් විසින් යාන්ත්‍රික තාක්ෂණ ඒකකයේ වැඩපල තුල ඇලුමිනියම් ලෝහ දඬු භාවිතයෙන් ඉනිමගක් සකස් කිරීමට අදහස් කරයි.

i ඒ අනුව ඉනිමඟ තැනීම සඳහා අවශ්‍ය දළ සැලසුම අඳින්න. (නියමිත මිනුම් සෙන්ටිමීටර වලින් ලකුණු කරන්න)

ii මෙම ඉනිමග තැනීමට අවශ්‍ය අමුද්‍රව්‍ය, ආවුද හා උපකරණ ලැයිස්තුවක් සකස් කරන්න.

iii එය සාදන ආකාරය පියවර කීපයකින් විස්තර කරන්න.

03. කර්මාන්ත ශාලාවක හෝ වැඩබිමක ක්‍රමානුකූලබව, ආරක්ෂාව හා පිරිසිදු බව ඉතා වැදගත් වේ.

i වැඩබිමක ක්‍රමානුකූලබව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය සාධක හතරක් ලියා දක්වන්න.

ii කර්මාන්තශාලාව තුළ යහපත් කාර්මික විනය පවත්වා ගැනීම සඳහා කළයුතු ක්‍රියාවන් තුනක් සඳහන් කරන්න.

iii කාර්මික කටයුතු සිදු කිරීමේදී ආලෝකය හා වාතාශ්‍රය ඉතා වැදගත් වේ. මේ සඳහා කර්මාන්තශාලාවක යොදා ඇති උපක්‍රම තුනක් සඳහන් කරන්න.


04. ලෝහ තහඩු ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනයේදී ඉතා වැදගත් කරුණක් වන්නේ එහි කල්පැවැත්මයි.

i වැඩ අවසන් කල ලෝහ භාණ්ඩයක එහි මතුපිට පෘෂ්ඨය නිමහම් කල යුත්තේ ඇයිදැයි කරුණු තුනක් සඳහන් කරන්න.

ii මෝටර් රථයක මතුපිට තහඩු රසායනික ද්‍රව්‍ය යොදාගනිමින් විසිරකයක් ආධාරයෙන් වර්ණ ගැන්වීම සිදුකරනු ලබන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

iii ලෝහ භාණ්ඩ ඔක්සිඩයිසින් කිරීමේ වාසි තුනක් සඳහන් කරන්න.

05. පහත රූපසටහනේ දැක්වෙන්නේ එන්ජිමක ජල සිසිලන ක්‍රමයකට අයත් පද්ධතියකි.



i. A, B, C, D, E, F අක්ෂරවලින් දැක්වෙන කොටස් නම් කරන්න.

ii මෙම ජල සිසිලන ක්‍රමය කුමක්ද?

iii මෙහි සිසිලන ක්‍රියාකාරීත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.


06. යන්ත්‍රයක් හෝ ඇටවුමක් මගින් ප්‍රදානය කරනු ලබන ජවය වෙනත් ස්ථානයකට ගෙනයාම ජව සම්ප්‍රේෂණය ලෙස හඳුන්වයි.

i. ජවය සම්ප්‍රේෂණය කිරීමට යොදාගනු ලබන විවිධ ක්‍රම හතරක් සඳහන් කරන්න.

ii ලීවර ඝන රැහැන් භාවිතා කර ජව සම්ප්‍රේෂණය කරන අවස්ථා තුනක් නම් කරන්න.

iii කප්පි දෙකක් එකිනෙකට විරුද්ධ දිශාවන්ට භ්‍රමණය කරගැනීම සඳහා එළවුම් පටියක් සම්බන්ධ කර ගන්නා ආකාරය රූපසටහනක් ආධාරයෙන් දක්වන්න.

07. යතුරු පැදියක සංඥා පහන් පරිපථයක රූප සටහනක් පහත රූපයෙන් පෙන්වා ඇත.



i. රූපයේ අංක 1, 2, 3, 4, 5, 6 නම් කරන්න.

ii. මෙම සංඥා පරිපථයේ ක්‍රියාකාරීත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. මෙම පද්ධතිය ආශ්‍රිත ඇතිවිය හැකි දෝෂ 2ක් හා ඒවා නිවැරදි කරන ආකාරය පිළිබඳව පැහැදිලි කරන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank